# දෙවිනුවර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 07 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ කාර්යාල ගොඩනැගිල්ලට අළුතින් කොටසක් එකතු කිරීම සඳහා වැය කළ රු.156,313 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු.259,830 ක වටිනාකම වූ ස්ථාවර වත්කම් ඒකක 05 ක අගය මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සභාව සතු දෙවිනුවර ලංකා බැංකු ගොඩනැගිල්ල පිහිටි රු.9,000,000 ක් වටිනා පර්චස් 22.34ක් වූ බිම් කොටසේ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු පර්චස් 33 ක ඉඩම් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සභාව සතු සේවක ඇප ආයෝජන වටිනාකම හා සේවක තැන්පත් ගිණුමේ වටිනාකම සමාන වියයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ඇප ආයෝජනවල වටිනාකම රු.14,000 ක් වූ අතර ආපසු ගෙවිය යුතු සේවක තැන්පත් වල වටිනාකම රු.20,700 ක් වූයෙන් රු.6,700 ක මුදලක් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි.

(ඊ) ජර්නල් සටහන් 49 ට අනුව ආදායම් ආපසු ගෙවීම් විශ්ලේෂණය කිරීමේදී ජර්නල් සටහන් වලට අනුව වෙනත් ආධාර රු. 2000 කින්ද, කුලී ආදායම් රු. රු.20,500 කින්ද හා සේවා ගාස්තු රු.54,140 කින්ද අදාල ගිණුම් හර කර තිබුණද ලෙජර් ගිණුම්වලට අනුව එවැනි ගැලපීමක් කර නොතිබුණි.

(උ) ආගරවල සිට උඩ අපරැක්ක හෙට්ටිආරච්චි පාර දක්වා මාර්ගය තාර දැමීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.319,708 ක් වූ අතර කර්මාන්ත ණයහිමි ලේඛනයට අනුව රු.511,937 ක් වූයෙන් රු.192,229 ක මුදලක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඌ) සභාව විසින් බැකෝ යන්ත්‍රය කුලියට දීමෙන් ලැබිය යුතු රු.197,070 ක මුදල ලැබිය යුතු කුලී ආදායම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවලට අනුව වටිනාකම රු.56,500,725 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව හා දෙන ලද තොරතුරු අනුව වටිනාකම රු.56,492,512 ක් වූයෙන් රු.8,213 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.635,082 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.45,529,839 ක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් මාරු කිරීමේ ගිණුමේ දැක්වෙන රු.821,995 ක මුදල 2008 වර්ෂයේ සිට දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පවතින අතර එය සමාලෝචිත වර්ෂයේද නිරවුල් කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.100,620,483 ක් වටිනා ගිණුම් විෂයයන් 12 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,261,579 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,702,562 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,820 | 1,848 | 2,748 |
| බදුකුලී | 16,698 | 16,520 | 7,473 |
| වෙනත් ආදායම් | 35,140 | 36,015 | 42,406 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු.412,921 ක උසාවි දඩ හා රු.18,749,330 ක මුද්දර ගාස්තු මුදල ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 ඡේදය ප්‍රකාර දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරීන්ගෙන් අයකරන සියයට 4 ක පොලී අනුපාතය අතර වෙනස රජය මගින් ප්‍රතිපූර්ණය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා රු.949,047 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණද එකී මුදල 2013 දෙසැම්බර් මස 31 දින වනවිටත් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ දකුණු පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ බැද්දෙගම්මැද්ද ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා උපකරණ ලබාදීමට ලැබී තිබූ රු.25,000 ක මුදලින් 2014 ඔක්තෝබර් මස 17 දින වන විටද එකී උපකරණ ලබා නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
| --- | --- | --- | --- | --- |
| විධායක | 01 | 02 | | 01 |
| ද්විතියික | 26 | 25 | 01 | |
| ප්‍රාථමික | 41 | 31 | 10 | |
| (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 28 | | 28 |
| | 68 | 86 | 11 | 29 |

(i) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.14,274,900 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල වැටුප් හා සභික දීමනා ලෙස රු.14,834,308 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.559,408 ක අතිරේක වැය බරක් වී තිබුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද සභාව 2013 වර්ෂයේදී සේවකයින් 28 දෙනෙකුට බඳවා ගෙන රු.4,154,369 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු
---------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1995 නොවැම්බර් 14 දිනැති පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක 95/15 චක්‍රලේඛයේ 3.3 ඡේදයේ විධිවිධාන වලට පටහැනිව සභාවේ මාසික සහා වාර්තා සකස් කිරීම වෙනුවෙන් 2013 වර්ෂයේදී ලේකම්වරයාට රු.10,000 මුදලක් ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 132 ඒ වගන්තිය ප්‍රකාර ප්‍රජා පිළිගැනීම් සම්බන්ධයෙන් හෝ පොදු වැදගත් කමකින් යුත් සිදුවීමක් වෙනුවෙන් සභා අරමුදලින් රු.1,000 කට වැඩි වියදමක් දරන්නේ නම් ඒ සඳහා අදාල ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ පූර්ව අනුමැතියක් රහිතව ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේදී රු.45,677 ක උත්සව වියදම් දරා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සඵල පාලන කාරකයක් ලෙසට යොදා ගෙන නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
------------------------------------

සභාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්ව නොතිබුණි.

5. පද්ධති හා පාලන
------------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ගබඩා පාලනය